# මා ගිය චාරිකා පොප්ප්

එච්. ඒ. ලවීනා ජයනි අධිභාෂිනි



# මා ගිය චාරිකා පොප්ප්

© එච්. ඒ. ලවීනා ජයනි අධිභාෂිනි

ප්‍රථම මුද්‍රණය - 2023

ISBN 978-624-208-035-2

චිත්‍ර සහ කතාව

**එච්. ඒ. ලවීනා ජයනි අධිභාෂිනි,**
**අංක 100, පුස්සතැන්නවත්ත,**
**ලැගුම්දෙණිය.**
**වට්ස් ඇප් අංකය - 0717451945**

ප්‍රකාශනය:

**මහාමයා බාලිකා විද්‍යාලය**

# පිදුම

පුංචි පැළයක් ගසක් වී අතු පතර විහිදා වැඩෙන්නට නම් බෝහෝ දේ ඊට අවසිමය මාලද භාග්‍යමත් දිවිමඟ සරසන්නට වෙර දරණ මාගේ පාසලේ ගරු විදුහල්පති තුමාටත් මාගේ පන්ති භාර සීයාලතා ගුරු මැණියන් ඇතුළු ගුරු මැණිවරු සියළු දෙනාට විශේෂයෙන් නිතරම සොයාබලමින් විද්‍යුත් පොතක් ලිවීමට මා දිරිමත් කළ මහාමායා බාලිකාවේ එම්.එම්. සෙනවිරත්න මහලේකම් ගුරු පියානන්ටත් මෙ පොත ප්‍රණාමයෙන් පුද කරමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතු න් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර


විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023 . 11 . 01

ගී කියලා - සතුටු වෙලා
බස් රථයේ - අපි යනවා
පාන්දරින් - අපි යන්නේ
වැදි ගම්මානේ -------------- //

අපි පාන්දරින්ම දොළුවට ගියා. නැන්දලා, මාමලා, ආච්චිලා, සීයලා, ලොකු පොඩි කවුරුත් චාරිකා බසය එනතෙක් බලා සිටියා.
බසය ආවා. හැමෝම බසයට නැග්ගා. උදේ පාන්දර නිසා හරිම සීතලයි.
හැම දෙනාම බසයේ ජනෙල් වැසුවා.



දොළුව විශ්‍රාම සමිතියේ මාමලා තමයි. මේ චාරිකාව සංවිධානය කළේ. ඉතිං සාමාජික පවුල් වල හැමදෙනා ම මේ චාරිකාව යන්න ආවා. ටික දුරක් යද්දී හැම දෙනාම අනෙක් අයව අඳුනා ගත්තා. ඔවුන් සමඟ කතා බහ කළා. ගී ගැයුවා. ඉර එළිය මුළු ලොවම එළිය වුණා. ඒ අතර මහනුවර පසු කරමින් බසය වේගයෙන් ගමන් කළා. ඔන්න එතකොට ම දහ අට වංගුව පටන් ගත්තා.

ඈතින් පළවෙනි කණුව පෙනුණා. අන්න පුතේ 2 කණුව සීයා කෙනෙක් කීවා. ඒ අතර 18 වෙනි කණුවත් ඈතින් පෙනුණා. හැබැයි පුංචි යාළුවනේ, අපි වටපිටාව බලන කොට දැන් දැන්ම මහියංගන පොලීසියට ළං වුණා. එතකොට මහියංගන පොලීසිය ළඟ බස් එක නැවැත්තුවා. එහෙන් අපට කෑම දුන්නා. ඒ දුන්නේ උදේ කෑම. ඉතිං අපි බස් එකට නැග්ගා. බසය වේගයෙන් ගියා.

වැදි ගම්මානය ළඟ නතර කළා. එතන පන්සල් පොප්ප කියලා. දාලා තිබුණා. අපි ඇතුලටම ගියා. එහෙ හරි ලස්සනයි. කැලයක් ඇතුලෙන් යද්දි එක තැනක බසය නතර කළා. හැමෝම බහින්න... බහින්න... නඩේ මාමා කෙනෙක් කිව්වා. හරි... ම ලස්සනයි. ගස් වැල් අතරින් පුංචි පාරකින් වනස්පතිතුමාගේ නිවස බලන්න ගියා. මැටි වලින් ගේ හදලා ඉළුක් අතු වලින් වහළ සෙවිලි කරලා. හරිම පිළිවෙළයි. හරිම ලස්සනයි. විශේෂ අවස්ථා වල ජායාරූප එල්ලා තිබුණා.

නායකතුමා අපිව සුහදව ආදරයෙන් පිළිගත්තා. ඉන්පසු කිරි කොරහා නටනවා බලන්න ගියා. ටික දෙනෙක්ට බුලත් කොළ

දුන්නා. එයාලා ඒවාගේ සල්ලි ඔතලා ආදාවාසියාට දුන්නා. බුලත් හම්බ වුන නැති අයත් නිකං සල්ලි දුන්නා.

කිරි කොරහා නැටුවේ අපට ආශිර්වාද පොප්ප මංද කොරන්ට කියා ආදිවාසියෙක් කිව්වා.

ඉතිං අපි ඊට පස්සේ කෞතුකාගාරයට ගියා. පැරණිම මිනිස් හිස් කබල් හා ඇට සැකිලි තිබුණා. ෂත්ත්ව හම්, ඇටසැකිලි බොට කඳයාගේ හිස් කබලද තවත් බොහෝ ෂතුන්ගේ හිස් කබල් ද නම් කර තිබුණා.



ඒ විතරක් නෙමෙයි, ඒ වැදි ගම්මානයේ අය ඉස්සර කාලයේ ජීවත් වුණ විදිය ලී වලින් හදලා තිබුණා. ඌරු වරිගෙ තිසා හාමි ආදීවාසි නායකතුමා අවුරුදු 110 ජීවත් වී තිබෙනවා. ඔහුගේ රුව ලී වලින් හදලා තිබුණා.

ඉස්සර ගින්දර ලබා ගන්න භාවිතා කරපු ගල්, ගල් ආයුධ, දුණු, ඊතල ආදිය ගොඩාක් දේවල් තිබුණා. විශාල ගස් වල පොතු වලින් නිර්මාණය කෙරූ අල්මාරි තිබුණා.



ඊට පස්සේ ටික දුරක් යද්දී පිට රටවල් වල ආදිවාසීන් ගැන තොරතුරු තිබුණා. ඒ විතරක් නොවේ. අපි ටික දුරක් යද්දී මීපැණි, තල, රටකජු, මුං ඇට, දුනු ඊතල, කී කිරිදිය ඇට වලින් හදපු වළලු, මිලදී ගන්න තිබුණා. අපි ඒවා මිලදී ගත්තා. ඊට පස්සේ අපි වතුර බොන්න ගියා.

එතකොට පුංචි කැකුළියක් එතනට බාල්දියක් ගෙන ආවේ වතුර ගන්න. මං එයාගෙන් ඇහුවා. කීය වසරේ ද කියලා, 6 වසරේ කියලා එයා ඉක්මනට එතනින් ගියා. එයා හැර වැඩි ගම්මානය තුළ වෙන එක කැකුළියෙක් වත් හිටියේ නැහැ. අනිත් සේරම කැකුළෝ විතරයි. අපි දුටුවේ ඉන්පසු අපි බසයට නැග්ගා. බසය වේගයෙන් ගියා.



දැන් සොරබොර වැවට නාන්න යන්නේ අපි. ගුරුවරියක් කීවා. ඕනෑම මිනිස් ජනාවාසයක මූලාශ්‍රය ගොඩ නැගී තිබෙන්නේ ජලය මුල් කර ගනිමිනි. සොරබොර වැව මැදි කර ගනිමින්, ආදි වාසී ජනාවාස බිහි වී තිබීම ද එයට කදිම නිදසුනකි. මෙවන් නවීන යුගයක දිවි ගෙවන අපට සොරබොර වැවේ ගල් තලාව තුළින් ජලය බැස යාමේ වාරි තාක්ෂණය බුලතා යෝධයාගේ තුන් කල් දැක්මේ නුවණ ලොව මවිත කරවන්නක් බව නඬේ මාමා කෙනෙක් විස්තරයක් කරමින් ඒ ගැන කියලා දුන්නා. ඉන් පසු අපි සොරබොර වැවෙන් නෑවා. එහෙ තිබෙන ගල් තලාවක් මැද්දෙන් කන්දක් නැගගෙන යනකොට තැනිතලාවක් තිබුණා.

උපි වැව් තාවුල්ලේ ඉඳලා සිසිල වින්දා. දිවා ආහාරය ගත්තා. බෝට්ටු යනවා. මාළු අල්ලනවා දැක්කා. වැව්තාවුල්ලේ රිළවුන් සිටියා. අපි එහෙන් අයිස්ක්‍රීම් කෑවා. ඊට පස්සේ අපි හැමෝම බසයට නැග්ගා.



බසයෙන් අපි ගියේ මහියංගන විහාරයට, අපේ බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටින කාලයේ වැඩම කළ පළමු ස්ථානය තමයි. මහියංගන සෑය ඉදි කර තිබෙන්නේ. සමන් දෙවි හාමුදුරුවෝ ජීවමානව සිටින කාලේ බුදුන් වහන්සේගෙන් කේශ ධාතු මිටක් රැගෙන මැණික් වලින් වෙහෙර හැදුවා. කියා නඬේ මාමා කෙනෙක් කිවුවා.



ඔන්න ඉතිං ඊට පස්සේ බසයට නැග්ගා. සිංදු කීවා. විනෝද වුණා. අප කාටත් හරි සතුටුයි.

ඉතිං ඔයාලටත් පුළුවන් මහියංගනයට ගිහිල්ලා මේ ලස්සන බලන්න

නිමි.





# මා ගිය චාරිකා පොප්ප්

## එච්. ඒ. ලවීනා ජයනි අධිභාෂිනි

### පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

9 786242 080352